දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2011/15

ඛ/12/13,
වැය ගිණුම් අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2011-07-29

සියළුම බන්ධනාගාර අධිකාරී/
සහකාර අධිකාරී වරුන් වෙත.

**මහා භාණ්ඩාගාර විවිධ තැන්පත් ගිණුම - ගිණුම් තැබීම් කටයුතු විධිමත් කිරීම**

01. උක්ත කරුණ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2011/06/03 දාතමින් යුතු රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 218/2011 හා බැඳේ.

02. ඒ අනුව 6000/0/0/3/148 විවිධ තැන්පත් ගිණුම සඳහා මුදල් තැන්පත් කිරීම 2009/02/01 දින සිට අත්හිටුවා 6000/0/0/15/112 පොදු තැන්පත් ගිණුම විවෘත කර පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන ලදී. 2009/01/29 දාතමින් නිකුත් කල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 200/2009 හා 6000/0/0/3/149 තැන්පත් ගිණුම සඳහා මුදල් තැන්පත් කිරීම 2010/04/01 දින සිට අත්හිටුවා 6000/0/0/6/0/81 පොදු තැන්පත් ගිණුම විවෘත කර පවත්වාගෙන යාමට උපදෙස් දී ඇත. තවද 2010/02/03 දිනැති අංක එස් ඒ/ඒ එස්/එම් එස්/එස්/6000/6 ලිපි කෙරෙහි අවධානය යොමු කර කටයුතු කල යුතු බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල් දන්වා ඇත.

03. 1. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 218/2011 හි 03, 1 ඡේදයේ උපදෙස් පරිදි 6000/0/0/3/148 හා 6000/0/0/3/149 පොදු තැන්පත් ගිණුම් වල තැන්පතු අවසන් වශයෙන් භාරගෙන 2011/02/01 දිනට වසර දෙකක් ගතවී ඇති බැවින් මෙම ගිණුම් වල තවදුරටත් ශේෂ පවතීනම් ඒවා මු.රෙ 570 පරිදි කල් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා එම සියළුම ශේෂ මු.රෙ 571 (2) පරිදි 2011/8/31 දිනට පෙර රජයේ ආදායමට බැර කල යුතුය.

2. එම ඡේදයේ දක්වා ඇති පරිදි 6000/0/0/3/148 හා 6000/0/0/3/149 ගිණුම් වල යම් තැන්පත් මුදලක් ඉදිරියේදී ගෙවීමට අත්‍යවශ්‍ය බවට නිශ්චිතව හඳුනාගත හැකිනම් එම තැන්පතු හරස් සටහන් මගින් නව තැන්පත් ගිණුම් වූ 6000/0/0/15/112 හා 6000/0/0/6/81 ගිණුම් වලට මාරු කල යුතුය. එසේ මාරු කිරීමට පෙර මේ සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම 1 හි ආකෘතිය මගින් ඉල්ලා ඇති විස්තර 2011/7/31 දිනට පෙර එම මාරු කිරීම් සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට මූලස්ථාන ගිණුම් අංශය වෙත ඉදිරිපත් කල යුතුය.

3. ඉහත 3. 1 හා 3. 2 ඡේද උපදෙස් අනුව කටයුතු කිරීමේදී පැරණි තැන්පතු ගිණුම් වලට අදාල භාණ්ඩාගාර පොත් වල දැක්වෙන ශේෂ පියවී යන පරිදි කටයුතු කල යුතුය. තවද භාණ්ඩාගාරය විසින් 6000/0/0/3/148 හා 6000/0/0/3/149 පොදු තැන්පත් ගිණුම් 2011/09/30 දින වන විට වසා දැමීමට කටයුතු කරන බැවින් එම දිනෙන් පසු 148 හා 149 ගිණුම් මත ගණුදෙනු සිදු නොකිරීමට ක්‍රියා කල යුතුවේ. ඒ අනුව ඉදිරියේදී පොදු තැන්පතු ගිණුම් කටයුතු මු.රෙ 570 හා මු.රෙ 571 හි සඳහන් උපදෙස් අනුව ක්‍රියා කර වාර්ෂිකව පොදු තැන්පත් ගිණුම් ශේෂයට අනුකූල වන කේවල ගිණුම් විස්තර සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බැවින් ඒ සඳහා උක්ත වාර්තා හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කල යුතු බව කාරුණිකව දන්වමි,

වී.ආර්.සිල්වා ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ අයිපී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

වී. ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිපී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
அரச கணக்குகள் திணைக்களம்
பொது திறைசேரி
Department of State Accounts
GENERAL TREASURY

දිනය / திகதி / Date: 2011-06-03

තැ. පෙ. අංක 1559, පළමුවන මහල, මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
த. பெ. இல. 1559, முதலாம் மாடி, செயலகம், கொழும்பு 01, இலங்கை.
P. O. Box 1559, 1st Floor, The Secretariat, Colombo 01, Sri Lanka.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 218/2011

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## <u>භාණ්ඩාගාර විවිධ තැන්පත් ගිණුම - ගිණුම් තැබීම කටයුතු විධිමත් කිරීම</u>

රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් 2009.01.31 දින දක්වා පවත්වාගෙන යනු ලැබූ 6000/0/0/3 කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 6003/0/0/01 සිට 25 දක්වා වූ, පොදු තැන්පත් ගිණුම් සඳහා මුදල් තැන්පත් කිරීම 2009.02.01 දින සිට අත්හිටුවමින් හා එදින සිට 6000/0/0/3 කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් කාර්ය සඳහා 6000/0/0/15 කාණ්ඩ හා 6003/0/0/01 සිට 25 දක්වා වූ පොදු තැන්පත් ගිණුම් සඳහා 6003/0/0/31 සිට 55 දක්වා වූ කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට උපදෙස් දෙමින් 2009.01.29 දාතමින් නිකුත් කල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 200/2009 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. මෙම චක්‍රලේඛයේ 3(1) ඡේදයේ උපදෙස් පරිදි 6000/0/0/3 කාණ්ඩයේ සහ 6003/0/0/1 සිට 25 දක්වා වූ කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම්වල තැන්පතු අවසන් වශයෙන් භාරගෙන 2011.02.01 දිනට වසර දෙකක් ගතවී ඇති බැවින් මෙම ගිණුම් වල තවදුරටත් ශේෂ පවතී නම්, ඒවා <u>මු.රෙ. 570</u> පරිදි කල් ඉකුත්වූ තැන්පත් ලෙස සලකා එම සියළු ශේෂ මු.රෙ. 571(2) පරිදි 2011.08.31 දිනට පෙර රජයේ ආදායමට බැර කිරීමට ක්‍රියා කළ යුතුය.

03. එහෙත් 2 ඡේදයේ සඳහන් තැන්පත් ගිණුම් කාණ්ඩවල ඇති යම් කෙනෙකුගේ මුදලක් ඉදිරියේදී ගෙවීමට අත්‍යාවශ්‍ය බවට නිශ්චිතව හඳුනා ගත හැකිනම්, එම තැන්පතු ගරස් සටහන් මගින් නව පොදු තැන්පත් ගිණුම වූ 6000/0/0/15 කාණ්ඩයේ තැන්පතු ගිණුමට හෝ 6003/0/0/31 සිට 55 දක්වා වූ කාණ්ඩයේ තැන්පතු ගිණුමකට මාරු කළ යුතුය. එසේ මාරු කිරීමට පෙර මේ සමග ඉදිරිපත් කර ඇති "ඇමුණුම 1" හි ආකෘතිය මගින් ඉල්ලා ඇති විස්තර ඉදිරිපත් කර එම මාරු කිරීම් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.

04. ඉහත 02 හා 03 ජෙද උපදෙස් අනුව කටයුතු කිරීමේදී පැරණි තැන්පතු ගිණුම් කාණ්ඩ වලට අදාළ භාණ්ඩාගාර පොත් වල දැක්වෙන ශේෂ පියවී යන පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වන අතර, 2010.12.31 දිනට හෝ 2011.03.31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වල දැක්වෙන ශේෂයට ඉන්පසුව වූ ගණුදෙනු ගැලපීමෙන් සංශෝධිත තැන්පතු ගිණුම් ශේෂවල නිවැරදිතාව තහවුරු කර ගත යුතුය.

05. භාණ්ඩාගාරය විසින් 6000/0/0/3 කාණ්ඩයේ හා 6003/0/0/01 සිට 25 දක්වා වූ කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් මුළුමනින්ම 2011-09-30 දින වන විට වසා දැමීමට කටයුතු කරන බැවින්, එම දිනෙන් පසු 6000/0/0/3 කාණ්ඩයේ හා 6003/0/0/01 සිට 25 දක්වා වූ කාණ්ඩයේ පොදු තැන්පත් ගිණුම් මත ගණුදෙනු සිදු නොකිරීමට ක්‍රියා කළ යුතු වේ. ඒ අනුව ඉදිරියේදී පොදු තැන්පත් ගිණුම් කටයුතු මු.රෙ 570 හා මු.රෙ 571 හි සඳහන් උපදෙස් අනුව ක්‍රියාකර වාර්ෂිකව පොදු තැන්පත් ගිණුම් ශේෂයට අනුකූලවන කේවල ගිණුම් විස්තරය සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

එස්.පී. දයාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :- විගණකාධිපති

## කාලාතීත පොදු තැන්පත් ගිණුම් වසා දැමීම

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව .................................... පොදු තැන්පත් ගිණුම් අංකය:-...............

වැය ශීර්ෂය :-.......................................................... ගිණුම වසා දැමූ දිනය :-.........................

<u>ඉදිරි ගෙවීම් සඳහා පොදු තැන්පත් ගිණුම් අංක 6000/0/0/15/....................</u>

6003/0/0/................ ගිණුමට මාරු කිරීමට අනුමැතිය ඉල්ලීම

| අනු අංකය | තැන්පත් කල අයගේ නම | කාරණය | තැන්පත් කල දිනය | මුදල | | ඉදිරියේදි ගෙවීමට අවශ්‍ය වීමට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | | රු. | ශත | |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |
| 6. | | | | | | |
| 7. | | | | | | |
| 8. | | | | | | |
| 9. | | | | | | |
| 10. | | | | | | |
| එකතුව | | | | | | |

ඉදිරි ගෙවීම් කටයුතු සඳහා අත්‍යාවශ්‍යම තැන්පතු පමණක් මෙම ලේඛණයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

..........................................................

ප්‍රධාන ගණකාධිකාරි

දිනය ........................